**ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**
---

ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 02 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**
---

**2.1 විසර්ජන ගිණුම**
---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**
---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 684.95 වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 678.99 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5.96 ක් හෙවත් සියයට 0.87 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 627.65 | 621.73 | 5.92 | 0.94 |
| මූලධන | 57.30 | 57.26 | 0.04 | 0.07 |
| **එකතුව** | **684.95** | **678.99** | **5.96** | **0.87** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 33 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් එකතුව රු.මිලියන 2,153.80 ක් වූ ප්‍රතිපාදන ලබා ගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,279.77 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 874.03 ක් හෙවත් සියයට 40.58 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 51.87 | 45.01 | 36.87 | 41.03 | 160.00 | 140.48 |

## 2.3 අග්‍රිම ගිණුම

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ වූ අංක 7002/0000/00/0312/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 76.50 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන අග්‍රිම ගිණුම් 07 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 270.49 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0070/000 | 0.36 |
| 6000/0000/00/0002/0095/000 | 0.27 |
| 6000/0000/00/0013/0063/000 | 50.89 |
| 6000/0000/00/0016/0046/000 | 202.48 |
| 6000/0000/00/0017/0016/000 | 11.54 |
| 6000/0000/00/0019/0009/000 | 4.02 |
| 6000/0000/00/0020/0003/000 | 0.93 |
| **එකතුව** | **270.49** |

## 2.5 විගණන නිරීක්ෂණය

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාව ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇප ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණු අතර අනෙක් ලේඛන පවත්වා නොතිබු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | වාහන පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | ණය ලේඛනය | මුදල් රෙගුලාසි 485 |
| (ඇ) | තොග පොත | මුදල් රෙගුලාසි 751 හා 763 |
| (ඈ) | ඇප ලේඛන | මුදල් රෙගුලාසි 891(1) |

### 3.2 විගණන සාක්ෂි නොවීම

වාර්තා කර ඇති පරිදි පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව රු.1,002,066 ක් වටිනා ගෙවීම් වවුචර් 6 ක් අභ්‍යන්තර විගණනයට ඉදිරිපත් කර තිබුණත්, 2016 ජුනි 30 දින වන විටද විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 විසර්ජන ගිණුම

#### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.150,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ii) වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ක සිට සියයට 11 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේදී නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය, ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පිළිවෙලින් රු.571,000,000, රු.96,028,066 ක් හා රු.179,403,173 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදී තිබූ අතර, එයින් පිළිවෙලින් රු.533,666,904 ක් , රු.89,659,386 ක් හා රු.104,820,594 ක් හෙවත් ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 93, සියයට 93 ක් හා සියයට 58 ක් ඉතිරි කර තිබුණි. ඒ අනුව ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණය නියමිත අරමුණු කරා යොමුකර නොමැති බව නිරීක්ෂණය විය.

### 3.4 පොදු තැන්පත් ගිණුම

මුදල් රෙගුලාසි 571(1) ප්‍රකාර පොදු තැන්පත් පිළිබඳ විස්තර ලැයිස්තු අර්ධ වාර්ෂිකව පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂයය අංක 27301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.3,415,930 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ණය ගෙවීමේ දී 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස රු.616,405 ක ආපදා ණය ගෙවා තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී පල්ලම හා මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පැවති හඳුනා නොගත් රු.162,524 ක ශේෂ නිසි පරිදි හඳුනා ගැනීමෙන් තොරව සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර තිබුණි.

(ඈ) විදේශගත වූ, විශ්‍රාම ගිය, මියගිය, වැඩ තහනම් කර ඇති හා සේවය හැර ගිය නිලධාරීන්/ සේවකයන්ගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/08/පොදු(1) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ 4:3 ඡේදය ප්‍රකාර කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) 2013 මැයි 13 දින විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් රු.19,533 ක් අයවිය යුතුව තිබුණු බව මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ වූ සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණද, එම නිලධාරියා විශ්‍රාම යන විට සියළුම ණය මුදල් අයකර ගෙන තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය වී තිබුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.6.1 අභ්‍යන්තර විගණනය

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 3.6.2 විගණන හා කළමනාකරණ කමිටුව

සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 03ක් පමණක් පවත්වා තිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැති වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| | | රු. | |
| ඉඩම් | 04 | 28,377,000 | වර්ෂයකට වැඩි |
| ගොඩනැඟිලි | 04 | 2,973,000 | - එම - |
| මෝටර් වාහන | 06 | දක්වා නැත. | - එම - |
| යන්ත්‍ර සූත්‍ර (ඇඟිලි සලකුණු යන්ත්‍ර) | 01 | දක්වා නැත. | - එම - |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2015 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු වත්කම්**

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව | ලබාදී ඇති ආයතනය | වටිනාකම | කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| | | | රු. | |
| ඉඩම් | 01 | සුරා බදු ගොඩනැගිල්ල | 10,000,000 | **දක්වා නැත.** |
| | 01 | ශ්‍රී ලංකා ජාතික ශිෂ්‍ය බට 35 වැනි බලකාය | තක්සේරු කර නැත | - එම - |
| | 01 | පුනරුත්තාපන කාර්යාලය | 4,000,000 | - එම - |
| ගොඩනැගිලි | 01 | සුරා බදු ගොඩනැගිල්ල | 1,300,000 | නැත. |
| | 01 | ශ්‍රී ලංකා ජාතික ශිෂ්‍ය බට 35 වැනි බලකාය | තක්සේරු කර නැත | - එම - |
| | 01 | පුනරුත්තාපන කාර්යාලය | 1,000,000 | - එම - |

## 3.8 අනුකූල නොවීම්

### (අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසියනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| VII වන පරිච්ඡේදයේ 12:2:3 වගන්තිය | කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් හා පරිපාලන නිලධාරී තනතුරු පුරප්පාඩු වීම පිළිබඳව පූර්ණ කාලීනව නිලධාරීන් පත්කරන ලෙස ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දන්වා තිබුණත්, එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 104 (2) | වාහන අනතුරු සම්බන්ධයෙන් විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 128(2)(ඇ) | සෑම අර්ධ වර්ෂයක් සඳහාම හිඟ ආදායම් වාර්තා පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කළයුතු වුවද, පිළියෙල කර තිබූ වාර්තා හෝ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 257 | සහතික නොකළ වවුචර්පත් සඳහා ගෙවීම් කර තිබුණි. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**---------------------------**

| | | |
|---|---|---|
| (i) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සියළුම වාහනවල ඉන්ධන දහනය මෙම චක්‍රලේඛයට අනුව මාස 06 කට වරක් පරීක්ෂා කර නොතිබුණි. |
| (ii) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන චක්‍රලේඛය | දීප ව්‍යාප්ත සේවාවල සේවය කරන නිලධාරීන් අවුරුදු 05 ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇත්නම් වෙනත් ස්ථානයකට ස්ථාන මාරුවීම් ලබා දිය යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක නිලධාරීන් වෙනුවෙන් එම චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**3.9 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**--------------------------------------------------------**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වු අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

**--------------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | | රු. | |
| මාලිගාවත්ත ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණය | මහවැව ප්‍රා.ලේ | 324,694 | වර්ෂාව සහිත කාලගුණය |
| මහවැව වැවේ ජල බස්නා වේල්ලේ පැති බැම්ම සැකසීම | - එම - | 863,220 | වර්ෂාව නිසා වැවේ සොරොව්වෙන් ජලය පිටාර ගැලීම. |
| පන්ගොඩ ඒ,බී ජනපදවල බෝක්කු ඉදිකිරීම | - එම - | 366,519 | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. |
| පහල වලහපිටිය හොරකැලේ කුඹුරු පාරට පානීය ජල පහසුකම් ලබාදීම | - එම - | 100,000 | ජාතික ජලසම්පාදනය හා ජලපවහන මණ්ඩලය වෙතින් ඇස්තමේන්තු නොලැබීම. |
| නැ/ඉරණවිල දියවර ගම්මානයේ ක්‍රීඩා පිටිය බොරළු දමා සකස් කිරීම | - එම - | 541,916 | බොරළු සපයා ගැනීමේදී මතු වූ ගැටළු නිරාකරණය කර ගැනීම අදාළ කාලය තුළ නොහැකි වීම. |
| කන්දකුලිය කුඩාව නෙවිල් මහතාගේ නිවස අසල සිට ඉදිරියට යන මාර්ගය ප්‍රතිසංස්කරණය | කල්පිටිය ප්‍රා.ලේ | 447,198 | අයහපත් කාලගුණය හා ප්‍රජා දායකත්වය ලබාගැනීමට අපහසු වීම. |
| පල්ලියවත්ත බත්තලංගුණ්ඩුව පල්ලිය අසල ප්‍රජා ශාලාව අලුත්වැඩියාව | - එම - | 2,259,612 | අයහපත් කාලගුණය හා ප්‍රවාහන අපහසුතා නිසා කිසිදු සමිතියක් ඉදිරිපත් නොවීම |
| කුඩිරිප්පුව යායේ තුංතුට්ටුව අමුණට කරකවා වැසිය හැකි ගේට්ටු 4 ක් සවි කිරීම | මාදම්පේ | 688,668 | වයඹ පළාත් මාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීමේ සැලැස්ම ප්‍රමාද කර ඉදිරිපත් කිරීම නිසා ඊට පසු කඩින් කඩ පැවති අධික වර්ෂාව හේතුවෙන් අදාළ අමුණ පිහිටි ප්‍රදේශය ජලයෙන් යටවී තිබීම. |
| කුඩිරිප්පුව ගොවි සංවිධානයට අයිති කුඹුරු යාය මැදින් ඇති මැද ඇළ සංවර්ධනය කිරීම | මාදම්පේ | 414,358 | වයඹ පළාත් මාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීමේ සැලැස්ම ප්‍රමාද කර ඉදිරිපත් කිරීම නිසා ඊට පසු කඩින් කඩ පැවති අධික වර්ෂාව හේතුවෙන් අදාළ අමුණ පිහිටි ප්‍රදේශය ජලයෙන් යටවී තිබීම. |

(ආ) **ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම**

**-----------------------------------------**

ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඇස්තමේන්තුගත වියදම රු.600,272 ක් වූ ගලටබැදියාව වැව/ තිඹිරි පොකුණ/ බැම්මේ වැව යන වැව්වල සොරොව්ව ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.278,893 ක් වැය කර තිබුණි. නමුත් වැව් බැම්ම සකස් කිරීමෙන් පසුව වන අලීන් බැම්ම මතින් ගමන් කිරීම හේතුවෙන් බැම්මට හානි සිදුවී තිබුණි. ඇස්තමේන්තුගත මුදල ඇතුළත කොන්ත්‍රාත්කරුට එය නැවත ප්‍රතිසංස්කරණය කිරීමට ඇති අපහසුතාවය නිසා ව්‍යාපෘති නිම නොකර අත්හැර තිබුණි.

(ඇ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**--------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිමකළ දිනය | 2015.12.31 දිනට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | | | | රු. | |
| එච් 7 ගම්මානය ප්‍රජා ශාලාවක් ඉදිකිරීම | ආණමඩුව | 1,381,665 | දක්වා නැත | දක්වා නැත | දක්වා නැත | 365,608 | පැවති අයහපත් කාලගුණික තත්ත්වය මත කොන්ත්‍රාත් සමිතිය වෙත අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී සිදුවී ඇති ප්‍රමාදය |
| දිවුල්වැව ජල ටැංකිය ඉදිකිරීම | - එම - | 1,231,212 | - එම - | - එම - | - එම - | 620,344 | |
| හොරගොල්ල දේවස්ථාන භූමියේ දහම් පාසල් ගොඩනැඟිල්ල ඉදිකිරීම | මහවැව | 1,078,438 | - එම - | - එම - | - එම - | 120,932 | වර්ෂාව නිසා උල්දිය සහිත මෙම භූමිය ජලයෙන් යටවීම |

(ඈ) **මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබු ව්‍යාපෘති**

**--------------------------------------------------------------**

ඉදිකිරීම් සම්බන්ධව ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයට මුළු මුදලම නිදහස් කර තිබුණත්, වැඩ පිළිබඳ නිසි ප්‍රගතියක් නොමැති අවස්ථා නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඇස්තමේන්තුගත පිරිවැය | නිදහස්කළ මුදල් | 2015.12.31 දිනට වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | | රු. | රු. | |
| මෝය දක්වා ජල සැපයුම දිර්ඝ කිරීම | හලාවත | 259,430 | 259,430 | ජල සම්බන්ධතාවය ලබාදී නොමැත. |
| මුන්නේෂ්වරම වාළුකුලම පානීය ජල ව්‍යාපෘතිය | - එම - | 661,018 | 661,018 | නළ එලා නැත. ජල සම්පාදන ලබා දී නැත. |

**3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළයුතු ශේෂ**

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත් රු.15,994 ක් වටිනා නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ කල් ඉකුත් චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉහළ පුලියන්කුලම ජල යෝජනා ක්‍රමය සඳහා නීලබැම්මේ සිට ජලය සැපයීමට මෝටරයක් ලබා ගැනීම සහ මෝටර් ගෘහය ඉදිකිරීම යටතේ ජලය ලබා ගැනීමට යෝජිත ළිඳ ආසන්නයේ කුඹුරු යායක් පැවැතුණි. වගා කරන කාලයේදී එහි වටේට වතුර පිරී වගුරු බිමක් ආකාරයෙන් පැවතීමෙන්, ජලයට කෘෂි රසායන හා පොහොරවල ඇති බැර ලෝහ වර්ග එකතු නොවේය යන්න මතභේදාත්මක ස්වරූපයේ පැවතුණි.

**3.12 අවිධිමත් ගනුදෙනු**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

2014 ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ ප්‍රජා මූල සංවිධානවලට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදීම සඳහා 10'x15' ප්‍රමාණයේ රෙදි හට් (කැනපි හට්) 231 ක් මිළදී ගැනීම සඳහා එකකයක් රු.34,000 ක් බැගින් රු.7,854,000කට ඇණවුම් ලබාදී තිබුණු අතර, මෙම මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පහත විධිවිධානවලට අනුකූල වී නොතිබුණි.

| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | විස්තරය |
|---|---|
| 4.3.1(අ),(ආ),(ඇ) මාර්ගෝපදේශ | සැලසුමක් හෝ ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| 4.3.1 මාර්ගෝපදේශය | තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි. |
| 3.2.2(අ) මාර්ගෝපදේශය | පුවත්පත් දැන්වීම් ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ වෙබ් අඩවිවලද පලකර තරඟකාරී ලංසු කැඳවීමක් කර නොතිබුණි. |
| 5.3.10 , 11 , 12 සහ 13 මාර්ගෝපදේශ | ලංසුවල වලංගු කාලය පිළිබඳ තොරතුරු සහ ලංසු සුරක්ෂණ හෝ ලංසු සුරක්ෂණ ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු බවට කොන්දේසි ඇතුළත් කර නොතිබුණි. |
| 6.3.1(ආ) හා (ඇ) මාර්ගෝපදේශ | ලංසු ඉදිරිපත් කිරීමේදී එකී මිළගණන් පිටපත් දෙකකින් හා මුද්‍රා තබන ලද කවරවල බහා ඉදිරිපත් කළයුතු බව කොන්දේසියක් දක්වා නොතිබුණි. |
| 6.3.4 මාර්ගෝපදේශය | මිල ගණන් විවෘත කිරීමේ විස්තර දක්වා නොතිබුණි. |
| 3.12.1(ඇ),(ඈ) හා 3.12.2(II) මාර්ගෝපදේශ | අන්තර්ජාලය හරහා නිෂ්පාදකයින් තෝරා ගැනීමට පෙර ඒ සඳහා ඔවුන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණි. |
| 7.11.1 මාර්ගෝපදේශය | තාක්ෂණික ඇගයීම් කමිටුවක් පිහිටුවා නොතිබූ බැවින්, එම කමිටුව ලංසු ඇගයීම් වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |

## 3.13 පාඩු හා හානි

හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හලාවත ජල සම්පාදන ක්‍රමයේ ජල නල එලීම සඳහා රු.9,850,000 කට තක්සේරු කරන ලද අංක 4905 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 දරන හෙක්ටයාර් 0.0997 ක් විශාල ඉඩම් කොටසෙහි අයිතිය 2013 ජුනි 21 දින සිට භාරගෙන තිබුණද, 2015 ඔක්තෝබර් 10 දින වන විටද වන්දි ගෙවා නොතිබුණි. ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක එල්/03ජේ/93/1 චක්‍රලේඛයට හා 1993 ඔක්තෝබර් 13 දිනැති අංක lD/05/D 08 දරන චක්‍රලේඛය අනුව පිළිවෙලින් දඩ මුදලක් හා රඳවාගැනීමේ බදු වශයෙන් එකතුව රු.1,706,512 ක් ගෙවීමට සිදුව තිබුණි.

## 3.14 අනාර්ථික ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් අංක 618 පුත්තලම දකුණ ප්‍රජා ශාලා ගොඩනැඟිල්ලේ වහලය මට්ටම දක්වා බිත්ති බැඳ තිබූ අතර, කර්මාන්තයේ ඉතිරි වැඩ නිම කිරීමට ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් එහි වැඩ නවතා දමා තිබුණි. පුත්තලම වැනි ලවන සහිත

පරිසරයක මෙසේ අර්ධ වශයෙන් ඉදිකර තිබූ කර්මාන්තයන් දිර්ඝ කාලයක් අතහැර දැමීම රජයේ මුදල් නිෂ්කාර්යව යොදවා තැබීමක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේ දින 100 සංවර්ධන වැඩසටහන යටතේ ඉහළපුලියන්කුලම ජල යෝජනා ක්‍රමය සඳහා නීලබැම්මේ සිට ජලය සැපයීමට මෝටරයක් ලබා ගැනීම හා මෝටර් ගෘහය ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.350,695 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු.257,467 ක් වැය කර තිබුණි. ජලය ලබා ගැනීමට යෝජිත වගා ළිඳෙහි ජලය පරිභෝජනයට සුදුසු බවට කිසිදු ලිඛිත සාක්ෂියක් නොතිබූ අතර, ජලා ප්‍රවාහන මණ්ඩලයේ කලාප පරීක්ෂණාගාරය - පුත්තලම වෙතින් නිකුත් කර තිබූ වාර්තාවට අනුව ජලයේ "ඊ" කොළයි හා "කෝලීපෝම්" බැක්ටීරියා ඇති බවත්, ඇමෝනියා ප්‍රමාණය සහ ෆ්ලෝරයිඩ් අධිකව අන්තර්ගතවීම සෞඛ්‍යයට අහිතකර බව වාර්තා කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට නොහැකිවී තිබුණි.

## 3.15 කළමනාකරණ දූර්වලතා

---------------------------

නියැඳි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පුරප්පාඩුව පැවති පරිපාලන නිලධාරී තනතුර සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම්ගේ 2011 ජනවාරි 23 දිනැති අංක ආ/4/6/10 දරන ලිපිය මඟින් පරිපාලන නිලධාරී ධූරයේ වැඩබැලීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ආවරණ අනුමැතියට යටත්ව රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරියකු පත්කර තිබුණද, විධිමත් අනුමැතියක් ලබා නොගෙන 2011 පෙබරවාරි සිට 2015 අගෝස්තු මාසය දක්වා රු.315,356 ක් වැඩ බැලීමේ දීමනාව වශයෙන් ගෙවා තිබුණි. පරිපාලන නිලධාරී තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් වැඩ බැලීමේ දීමනා ගෙවීම සම්බන්ධයෙන් විගණනයෙන් පෙන්වා දුන් පසුවද එය නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන යටතේ නීලබැම්ම ජල යෝජනා ක්‍රමයේ පානීය ජල ටැංකිය අදියර දෙකකින් ඉදිකිරීමට යෝජිතව තිබුණි. පළමු අදියර නිමවී බිල්පත් නිරවුල් කර තිබුණු අතර දෙවන අදියර සඳහා ගිවිසුම්ගත වටිනාකමෙන් සියයට 20 ක අත්තිකාරම් ලබාදී තිබුණි. භෞතික විගණන පරීක්ෂාවේදී එහි වැඩ ආරම්භ කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර, සාවද්‍ය මිනුම් උපයෝගී කර ගනිමින් (මිනුම් වාර්තා සකස් කිරීමකින් තොරව) රු.229,973 කට ගෙවීම් වාර්තා සකස් කර 2014 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබූ අත්තිකාරම් මුදල පියවීමට කටයුතු කිරීමෙන් නිලධාරීන් විසින් වගකීමකින් තොරව රජයේ මුදල් අයථා ලෙස පරිහරණය කිරීමට අදාළ පාර්ශවයන් පොළඹවා ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) 2014 වර්ෂයේ පළාත් නැඟුම වැඩසටහනේ අවිච්ඡේද වැඩ විෂයයන් යටතේ ක්‍රියාත්මක කර තිබූ මදුරගම ප්‍රජා ශාලාව ඉදිකිරීමෙහි ගිවිසුම්ගත වටිනාකම රු.1,265,220 ක් වී තිබුණි. ඉටුකළ වැඩ විෂයයන් 08 ක් වෙනුවෙන් රු.596,862 ක් කොන්ත්‍රාත් සමිතියට ගෙවා තිබුණද, එහි ඉදිකිරීම් නවතා දමා තිබුණි. ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කාර සමිතියට එරෙහිව ගිවිසුම් ප්‍රකාරව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කට්ටකඩුව වැව අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම සහ පුල්ලයාර් කෝවිල් පාර කොන්ක්‍රීට් ගල් ඇතිරීම සඳහා රු.1,250,000 ක් බැගින් වූ කොන්ත්‍රාත්තු ප්‍රදේශයේ ස්වේච්ඡා සමිතියකට පිරිනමා තිබුණි. සමිතියේ මූල්‍ය ශාක්‍යතාවය පිළිබඳ තහවුරුවක් හා කර්මාන්ත සිදු කිරීමේ ශිල්පීය හැකියාව හා අනෙකුත් සම්පත් සපයා ගැනීම පිළිබඳ තහවුරුවකින් තොරව කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි.

(ඉ) පල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දොරින් දොරට - ගමින් ගමට ගම් 15,000 ක් නඟා සිටුවීමේ වැඩසටහන යටතේ ඉටුකළ පුලියන්කුලම මණ්ඩලාන විදුහලේ සෙල්ලම් මිදුල සංවර්ධනය, වතුපොල දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම සහ නුර් පල්ලියේ දහම් පාසල සඳහා වැසිකිලියක් ඉදිකිරීම යන ව්‍යාපෘති 03 හි මිනුම් වාර්තා සකස් කර නොතිබුණි.

## 3.16 මානව සම්පත් කලමනාකරණය

-----------------------------------

(අ) **අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 43 | 13 | -- |
| (ii) | තෘතියික මට්ටම | 34 | 15 | 19 | -- |
| (iii) | ද්විතියික මට්ටම | 1136 | 960 | 176 | -- |
| (iv) | ප්‍රාථමික මට්ටම | 175 | 165 | 10 | -- |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | -- | 01 | -- | 01 |
| | **එකතුව** | **1401** | **1184** | **218** | **01** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

අනියම් පදනම මත බඳවාගෙන තිබුණු සේවකයකු සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

---------------------------------------------------------------------

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත සංවර්ධන නිලධාරියෙකු නිශ්චිත කාල වකවානු සඳහන් නොකර පුත්තලම මහ රෝහල වෙත සමාලෝචිත වර්ෂයේදී මුදා හැර තිබුණි.